# සාම විගඩමේ නව ජවනිකාව

ජනාධිපතිනිය තවත් සාම වටයක් අරඹා ඇත. විවිධ පක්ෂවලට හා සංවිධානවලට ආරාධනා කර ඒ පක්ෂවල හා සංවිධානවල අදහස් විමසීම යන්නේ එතුමිය අදහස්කරන්නේ එතුමියගේ අදහස ඒ පක්ෂ හා සංවිධාන ලවා ඉටුකරවා ගැනීමට බව පැහැදිලි ය. නව වටය ආරම්භ කර ඇය ඔස්ලෝ ගිවිසුම පිළිබඳ අදහස් සමුළුව හමුවේ තබා ඇත. ජනාධිපතිනියට අවශ්‍ය ඔස්ලෝ ගිවිසුම මත පදනම් ව සාකච්ඡා ඇරඹීම ය.

ඔස්ලෝ ගිවිසුමට ඒ ජා පක්ෂය එකඟ විය. එය ද කොටි සංවිධානයේ වුවමනාවට මෙන් ම බටහිර ක්‍රිස්තියානි ආධිපත්‍යයෙහි අවශ්‍යතාව ද නිසා ඇතිකරගන්නා ලද්දකි. කෙසේ හෝ ඔස්ලෝ ගිවිසුම මත පදනම්වීම යනු කොටි සංවිධානයට ඉන් එහාට ගොස් යමක් ලබා දීම මිස අනෙකක් නො වෙයි. ඔස්ලෝ ගිවිසුමෙන් එහාට ඇත්තේ අන්තර්වාර ස්වයං පාලන අධිකාරියක් හෙවත් වෙනම ආණ්ඩුවක් උතුරු හා නැගෙනහිර පළාත්වල පිහිටුවීමට ය.

ජනාධිපතිනිය ආරම්භකළ අළුත් සාම මණ්ඩල සාකච්ඡා කාලය, ධනය හා ශ්‍රමය කා දැමීමක් පමණක් ය. ජනාධිපතිනිය කළ යුත්තේ කුමක්දැයි දැනටමත් තීරණය කර ඇත. ඇගේ අදහස් අනෙක් සංවිධාන හා පක්ෂ ලවා සම්මත කරවීම ඇගේ අරමුණ වෙයි. ඇගේ උපක්‍රමය පිටුපස බටහිරයන් ද ඇතැයි අපේක්ෂාකළ හැකි ය. ඔස්ලෝ ගිවිසුම යනු තවත් සන්ධීය ගිවිසුමක් මිස අනෙකක් නො වෙයි. ඒ ගිවිසුමට අනුව කොටි සංවිධානය මානව අයිතිවාසිකම් යැයි බටහිරයන් කියන දෑ රැකීමට බැඳී නැත. එහෙත් ආණ්ඩුව ඒ රැකීමට බැඳී ඇත. සන්ධීය රාජ්‍යය පිහිටුවන තුරු කොටින්ට ලංකාවේ ඕනෑම තැනක ඕනෑම මිනීමැරමක් කිරීමට හැකි ය යන්න මෙයින් කියැවෙන්න වෙයි. සන්ධීය රාජ්‍යය, ඇත්තටම සහසන්ධීය රාජ්‍යය, පිහිටුවීමෙන් පසු කොටි කරන්නේ කුමක්දැයි දැනගැනීමට ජේන බැලිය යුතු නො වෙයි.

කලින් ද කියා ඇති පරිදි ලෝකයේ සිටින නිවට ම නායකයන් ඇත්තේ සිංහලයන්ට ය. 1815න් පසු ඉංගිරිසිහු මේ තත්ත්වය උදාකිරීමට කටයුතු කළහ. සිංහලයන්ගේ සාම්ප්‍රදායික නායකත්වය විනාශ කිරීමෙන් හෝ තනතුරු හා වරප්‍රසාද දී තමන් වෙත නම්මා ගැනීමෙන් හෝ සිංහලයන්ට සිංහලයන්ගේම නායකත්වයක් නැතිකළ ඉංගිරිසිහු සිංහලයන් වෙනුවෙන් පරගැති නිවට නායකයන් පත්කළහ. අද ද අපට ආණ්ඩු පක්ෂයේ මෙන් ම විරුද්ධ පක්ෂයේ ද ඇත්තේ මේ නිවට නායකයන් ය.

ඔසාමා බින් ලාඩින් සමග හෝ සදාම් හුසේන් සමග හෝ සාකච්ඡා නොකරන ඇමරිකාව හා එහි ජනාධිපති අපට කොටි සමග සාකච්ඡා කිරීමට කියයි. රුසියාවේ පුටින් කිසි දිනෙක චෙච්නියාවේ ත්‍රස්තවාදී බෙදුම්වාදීන් සමග සාකච්ඡා නොකරයි. ඒ ඉතා අමානුෂික ආකාරයකින් කුඩා ළමුන් ඉගෙන ගන්නා පෙරපාසලක සිදු වූ ම්ලේච්ඡ ඝාතනයකින් ද පසුව ය. බ්‍රිතාන්‍යය ඔවුන්ට සුපුරුදු සටකපට රාජ්‍යතාන්ත්‍රික ක්‍රම මගින් අයි ආර් ඒ සංවිධානය මුලාකරමින් හා මෙල්ලකරමින් සිටියි. චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය හා ඇ වටා සිටින ඇම්බැට්ටයෝ බටහිරයන් හමුවේ දනින් වැටෙමින් කොටින්ට සියළුම පහසුකම් ලබා දෙති. මේ නිවටකම මිස අනෙකක් නො වෙයි.

අප සැමදාමත් කියා ඇති පරිදි බටහිරයන් කටයුතු කරන්නේ සිංහලත්වයට එරෙහිව ය. ඔවුහු එහි දී දෙමළ ජාතිවාදය උපයෝගී කරගනිති. එපමණක් නොව සිංහලත්වයට එරෙහිව, ඔවුන් විසින් පත්කරන ලද සිංහල නායකයන් ද යොදාගනිති. කුමාරතුංග මහත්මිය කුමක් විශ්වාස කළ ද බටහිරයන් ඇය දකින්නේ තව අවුරුදු දෙකකින් පමණ දේශපාලනයෙන් විශ්‍රාම ගැනීමට සිටින කාන්තාවක් ලෙස ය. මේ අවුරුදු දෙක සඳහා ඔවුන් සූදානම් වන්නේ කෙසේ ද? පැහැදිලිව ම බටහිරයන්ට අවශ්‍යකරන්නේ රනිල් වික්‍රමසිංහ මහතා ජයග්‍රහණය කරවීම ය. රනිල් වික්‍රමසිංහ මහතා ලවා සහසන්ධීය රාජ්‍යය, එයටත් වැඩි අන්තර්වාර ස්වයංපාලන ආණ්ඩුව, කොටි සංවිධානයට ලබාදීමට හැකි වෙයි. මේ අවුරුදු දෙක යොදා ගැනෙන්නේ චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය ලවා ඒ සඳහා පාර කප්පවා ගැනීමට ය.

අද රාජ්‍ය නොවන සංවිධානවල සිටින උගතුන් යැයි කියන පිරිස් මතු එන දෙමළ ඊලම ගැන උදම් අනමින් කතාකරති. කොළඹ විශ්ව විද්‍යාලයේ දේශපාලන විද්‍යාව උගන්වන්නකුට අනුව වැඩිකලක් නොගොස් ලංකාවේ ද්විත්ව

© Prof. Nalin De Silva

පාලන තත්ත්වයක් ඇතිවනු ඇත. සම්ම ජාතියේ තමාගේ යැයි කිවහැකි කිසිවක් කියා නොමැති ඔහු අද දොඩවන්නේ ඔහුට බටහිරස්වාමිවරු කියා දෙන දේ ය. බටහිරයන් සිතන පතන ආකාරය මුළුමනින්ම මේ ගැත්තන්ට නොකියන නමුත් බටහිරයන්ගේ සිතුම් පැතුම් ගැන අවබෝධයක් මේ අඟුටුමිට්ටි බුද්ධිමතුන්ගේ ලිපි කියවීමෙන් දැනගත හැකි ය.

බටහිරයන් රටේ ආර්ථිකය ගිරයට හුවූ පුවක්ගෙඩියක් බවට පත්කර ඇත. ආර්ථික ප්‍රශ්නත් සමග ජනතාවට කෑම බීම පිළිබඳ ප්‍රශ්නයක් එයි. රනිල් වික්‍රමසිංහ මහතාට ජනාධිපතිවීමට අවශ්‍ය වන්නේ කොළඹ හා තදාසන්න ප්‍රදේශවල බෝම්බයක් දෙකක් පිපිරවීම පමණ ය. කන්න දෙන්නම් සාමය දෙන්නම් කියමින් රනිල් වික්‍රමසිංහ මහතා රට වටේ යනවිට ආණ්ඩුව කරන්නේ කුමක් ද?

එහෙත් මෙයින් කියැවෙන්නේ රනිල් වික්‍රමසිංහ මහතා බලයට පැමිණියහොත් සාමය ලැබේය යන්න නො වෙයි. මෙහි දී කිවයුතු දෙයක් වෙයි. සාමය යන වචනය යොදා ගත්තද ලෝකයේ විවිධ සාම වෙයි. ලංකාව සම්බන්ධයෙන් ගත්කල බටහිරයන්ට අවශ්‍ය සාමය එකකි. ඉන්දියාවට අවශ්‍යවන්නේ වෙනත් සාමයකි. දෙමළ ජාතිවාදයට අවශ්‍ය සාමය බටහිරයන්ට අවශ්‍ය සාමය වෙයි. මේ සියළු දෙනාම සාමය යැයි කියමින් තම තමන්ට අවශ්‍ය සාමය  ලබාගැනීමට කටයුතු කරති. එහෙත් සිංහලයන්ට අවශ්‍ය සාමය කුමක් දැයි සිංහලයෝ දනිත් ද? ඔවුන් දන්නා එකම දෙය අප සාමයට විරුද්ධ නැහැයි කීමට පමණකි.

බටහිරයන්ගේ. දෙමළ ජාතිවාදයේ හා රාජ්‍ය නොවන සංවිධානවල කුලියට වැඩකරන උගතුන්ගේ සාමයට අපි විරුද්ධ වෙමු. මේ උගතුන්ට ඩොලර්වලින් නොගෙවන්නේ යැයි මොවුන් කියන්නේ ද? පසුගිය අවුරුදු පහළොවක පමන කාලයෙහි මේ උගතුන්ගේ බැංකු ගිණුම් පරීක්‍ෂා කෙරෙන්නේ නම් යමක් කිවහැකි වනු ඇත. ඉන්දියාවට අවශ්‍ය වන්නේ වෙනම ම සාමයකි. එහි ඇත්තේ ඉන්දියාවේ අවශ්‍යතාව මිස ලංකාවේ සුභ සිද්ධිය නොවන බව අවධාරණය කළ යුතු ය. සිංහලයන්ට ද සාමය අවශ්‍ය ය. එහෙත් ඒ සාමය අවශ්‍ය වන්නේ ඒකීය ලංකාවක ය. උතුරු හා නැගෙනහිර පළාත්වලට ආණ්ඩු බලය දීමෙන් ඒ පලාත්වලට පිටින් සිටින බහුතර දෙමළ ජනයාගේ ඇතැයි කියන ප්‍රශ්නය නො විසඳෙයි. ඔවුන්ට ප්‍රශ්නයක් ඇත්නම් ඒ විසඳිය හැක්කේ ද ඒකීය ලංකාවක ය. මෙයින් අදහස් කරන්නේ දෙමළ ජනයාට දෙමළවීම නිසාම ප්‍රශ්නයක් ඇතැයි යන්න නො වෙයි.

රනිල් වික්‍රමසිංහ මහතාගේ සාමයට, එනම් බටහිරයන්ගේ සාමයට ඉන්දියාව විරුද්ධවනු ඇත. එවිට කුමක් සිදුවේ ද? ඔහුගේ ජේ. ආර් ජයවර්ධන මාමාගේ කාලයේ සිදු වූ දේ වඩා උපක්‍රමශීලීව කිරීමට ඉන්දියාව සමත්වනු ඇත. අවසානයේ දී බටහිරයන්ට, ඔවුන්ගේ දේශපාලන, මෙන්ම උගතුන් යැයි කියන ගැත්තන්ට සිදුවනු ඇත්තේ ඉන්දියාවට දණගැසීමට ය. ඒ සමග අපේ ස්වාධීනත්වය තවත් වරක් තවත් අයකු අතින් නැතිවනු ඇත. ඉන්පසු සිංහලයන්ට සිදුවනු ඇත්තේ ඉන්දියාව සමග ගැටුමක් ඇතිකර ගැනීම ය. එවිට මේ රටට අවුරුදු පණහකටවත් සාමයක් උදානොවනු ඇත.

විවිධ සාම ඇති විට ඉන් එක් සාමයක් තෝරාගන්නේ කෙසේ ද? ඒ කළ හැක්කේ සාකච්ඡාවෙන්  නො වෙයි. සාකච්ඡාවෙන් කෙරෙන්නේ බලවතාගේ මතය නිවටයා පිට පැටවීම ය. මේ සාකච්ඡාවලදී ඇතැමුන් කියන පරිදි බටහිරයන්ගේ තර්කය, හේතුවාදය ආදිය බලපාන්නේ නම්  ඇමෙරිකාව කළ යුත්තේ වහාම සදාම් හුසේන් සමග සාකච්ඡා ඇරඹීම ය. එහෙත් සදාම් හුසේන් නිවටයෙක් නො වෙයි. එබැවින් බුෂ් බ්‍රිතානියේ බ්ලෙයාර්ගේ ද අනුමැතිය ඇතිව ඉරාකයේ යුද්ධයක් ආරම්භකර ඇත. සාම සාකච්ඡා ඇතිවීමට අවශ්‍ය පූර්ව කොන්දේසියක් නම් එක් පාර්ශ්වයක නිවටයන් සිටීම ය. ආණ්ඩුවේ නිවටයන් නොවන අය අද කළ යුත්තේ මේ සියල්ල පිටුපස ඇති තොරතුරු, බටහිරයන්ගේ බලපෑම් ආදිය, ජනතාවට ඉදිරිපත් කර ප්‍රභාකරන් හා කොටි සංවිධානය මර්දනය කිරීමට සූදානම් වීම ය. ඒ නොකළ හැක්කක් නො වෙයි. කොටින්ට ඇත්තේ බටහිරයන්ගේ හා රාජ්‍ය නොවන සංවිධානවල ප්‍රකාශන හයි හත්තිය පමණ ය. ජනතාව ඒකරාශි කරන්නේ නම් මොවුන් පැරදවීම අමාරු නැත ~

© Prof. Nalin De Silva